අපි හොඳ යාළුවෝ

අඹගස : තාරක පුතා මොකද අද පාඩම් කරන්න එන්න පරක්කු වුණේ ?
මම මේ මඟ බල බලා සිටියේ.

තාරක : ගුරුතුමී ගෙදර වැඩට ගණන් ටිකක් දුන්නා. මම ගණන් ටික හදලා ආවේ.

අඹගස : අදත් පුතා ආවේ පාඩම් කරන්න

2021 ජුනි 21 සිට ජුනි 27 දක්වා සතිය

තාරක : ඔව් ඔව් අද මම කියවීම් පොත අරගෙන ආවේ. 'ගස්වැල් සුමිතුරෝ' කියන කවි පාඩම් කරන්න.

අඹගස : ඒක හොඳයි. මම ගැන කියන තොරතුරුත් තියෙනව ද ?
කියන්නකෝ බලන්න ලස්සනට.

තාරක : කෝ අද ගිරා යාළුවා. වෙනදට නම් මෙතනට ඇවිල්ලා.

ගිරවා : ඉනන් වා. ඉනන් වා . . . මම මේ අඹ අතත් උඩ. ඔයාලා දෙනන් ගේ කතාව මට ඇහුණා.

තාරක : එහෙනම් දෙන්නම දැන් අහගෙන ඉන්න. මම කවි කියනවා.

බලන බලන හැම තැනක ම කොළ පාටින් ගස් ගොඩයි
ගස් සෙවණේ සිටින විට දී ගස්වැල් මිතුරන් වගෙයි
පුංචි පුංචි ගස් ලොකු වී දළු මල් පල හටගනියි
ඒ මල් පල සැමට ම දී මිතුදම තව වැඩි කරයි

ගිරවා : හරි ම ලස්සනයි. ගස් ගැන කවි ඇහෙන කොටත් සතුටු යි.

අඹගස : ඔව්. ඔව්. තාරක පුතා ලස්සනට කවි කිවුවා.

ගිරවා : තාරක පුතා අද අඹ කෑවෙත් නැහැ නේද ?

තාරක : තව ම කෑවේ නැහැ. ඔයාලත් එක්ක කතා කරන එක ඊට වඩා සතුටු යි.

ගිරවා : මම අඹ කඩල දෙන්න ද?

අඹගස : ඔව් ගිරා යාළුවේ. තාරක පුතාට අඹ කඩලා දෙන්න.

තාරක : නංගිටයි, මල්ලිටයි, මටයි ගෙඩි තුනක් තිබුණා ම ඇති.

අඹගස : තාරක පුතා හරි ම හොඳයි. හැම දා ම නංගිටයි, මල්ලිටයි අඹ ගෙනියනවා.

තාරක : ස්තුති යි ගිරා යාළුවේ. මට අඹ දුන්නට අඹ ගසටත් බොහෝ ම ස්තුති යි.

අඹගස : තාරක පුතා පරිස්සමින් ගෙදර යන්න. හෙටත් පාඩම් කරන්න එන්න.

ගිරවා : ඔව් හෙටත් එන්න. අපි දෙන්න ම බලාගෙන ඉන්නවා.

- ඉහත දැක්වෙන සංවාදය නිවසේ වැඩිහිටියන් සහභාගීකරගෙන කරන්න

- ඔබත් පහත මාතෘකා යටතේ සංවාද ගොඩ නගන්න
  1* මල සහ ළමයා
  2* පූසා සමග මීයා
  3* හිරමණය සමග පොල් බෑය